# රුසියානු ආකෘතික වාදය හා භාරතීය අලංකාර වාදය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

ලොකු බඳු ජයසූරියගේ වගීෂානි[1]

විසි වැනි සියවසේ මුල් යුගයේ දී රුසියාවේ ප්‍රචලිත වූ "රුසියානු ආකෘතික වාදය" නමැති විචාර මාර්ගය සහ භාරතයේ සංසක්ෘත කාව්‍ය විචාර මූලධර්මයක් ලෙස ප්‍රචලිත වූ "අලංකාර වාදය" පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මේ පර්යෙෂ්ණයේ මූලික අරමණ වේ. පෙරපර දෙදිග ප්‍රභවය වී විකාසනය වූ විචාර වාද කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ඇතැම් පෙරදිග හා අපරදිග විචාර සංකල්ප අතර තුලනයක් පවතින බව විද්‍යමාන වේ. අපරදිග විචාර සංකල්පයක් වන ප්‍රායෝගික විචාරය හා සංස්කෘත ධ්වනි වාදය අතර පවතින සාම්‍යය පිළිබඳ ව සිදු කෙරුණු අධ්‍යයන මෙයට නිදසුන් ලෙස දැක්විය හැකි ය. මේ ආකාරයට ම රුසියානු ආකෘතික වාදය නමින් ප්‍රචලිත වූ අපරදිග විචාර වාදය හා අලංකාර වාදය නමින් ප්‍රචලිත වූ පෙරදිග සංසක්ෘත සාහත්‍ය විචාර වාදය අතර යම් සාම්‍යයක් නිරීක්ෂණය කළ හැකි ද යන්න අවධානයට ලක් විය යුතු කරුණකි. මෙහි දී රුසියානු ආකෘතික වාදය හඳුන්වාදෙමින් එය ප්‍රචලිත කිරීම සඳහා උත්සුක වූ රෝමන් යේකොබ්සන්, වික්ටර් ෂ්ක්ලොව්ස්කි හා බැරිස් එලෙන්ගෙමෝව් වැනි විචාරකයන් විසින් විග්‍රහ කරන ලද මේ විචාර වාදයේ මූලික ලක්ෂණ සහ භරතමුනි, භාමහ, දණ්ඩින් ඇතුළු පශ්චාත් කාලීන සංස්කෘත ආලංකාරිකයන් විසින් උත්කර්ෂයට නංවන ලද අලංකාර වාදයේ මූලික ලක්ෂණ පිළිබඳ ව සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කෙරේ. රුසියානු ආකෘතික වාදය හා අලංකාර වාදය යන විචාර වාද ද්වයය ම පඨිතය කේන්ද්‍ර කොටගත්, සෞන්දර්ය ධාරණාව හා බැඳුණු විචාර මාර්ග වන බවත්, මේ ශික්ෂණයන්හි දී පඨිතයෙන් පිටතට නැඹුරු වූ ඓතිහාසික, සමාජ විද්‍යාත්මක යනාදි කරුණු කෙරෙහි අවධානය යොමු නො වන බවත් නිරීක්ෂණය කළ හැකි ය. එසේ ම බාහිර සංස්පර්ශකයන්ගෙන් තොර ව කෘතිය තුළින් ම සාහත්යික භාවය ගවේෂණය කළ යුතු ය යන්න ද මේ විචාර මාර්ගයන් ඔස්සේ අවධාරණය කෙරේ. මේ අනුව බලන කල සාහිත්යික පඨිතයක පිළිබිඹු කෙරෙන භාෂාත්මක ප්‍රතිනිර්මාණය කෙරෙහි මූලිකාවධානය යොමු කරමින්, සෞන්දර්යාත්මක ප්‍රවේශයකින් යුතු ව ඒ කෘති විචාරයට ලක් කිරීම අරමුණු කොටගත් මේ විචාර මාර්ග ද්වයයෙහි සම විෂමතා අතර තුලනයක් සිදු කළ හැකි බව සසාධක ව පෙන්වාදිය හැකි ය.

**ප්‍රමුඛ පදඃ** රුසියානු ආකෘතික වාදය, අලංකාර වාදය, පඨිතය, සෞන්දර්ය ධාරණාව, පෙරපර දෙදිග සාහිත්‍ය විචාරය

[1] සිංහල අධ්‍යයනාංශය